# 5 ප්‍රේමයෙන් දිවි ගෙවමු

**ප්‍රේමය විශ්වීය පණිවුඩයක් ගෙන දෙන වචනයකි. සකල විශ්වයේ අධිපතියාණන් වන දෙවියන් වහන්සේ "ප්‍රේමය" වන අතර, උන්වහන්සේ එම ප්‍රේමය ලොවට දායාද කළ සේක. මෙලෙස දායාද කළ ප්‍රේමය දෙවියන් වහන්සේ හා මිනිසා අතරත්, දෙවියන් වහන්සේ හා මැවීම අතරත්, මිනිසා හා මැවිල්ල අතරත්, එකිනෙකට සම්බන්ධ වන ගැඹුරු අර්ථවත් දේව දායාදයකි. මෙම පාඩමින් එම ප්‍රේමයේ වටිනාකම තහවුරු කර ගැනීම අපේක්ෂිත ය.**

**1 කොරින්ති 13, එපීස 3:17-19, මාර්ක් 12:29-33**

මිනිසා කෙරෙහි දෙවියන් වහන්සේගේ ප්‍රේමය ලොව ආරම්භයේ දී ම විද්‍යමාන විය.

මිනිසාගේ අකීකරුකම හා තෘෂ්ණාව හේතු කොටගෙන, දේව ප්‍රේමයෙන් ඈත්වීම සිදු විය.

මේ නිසා මිනිසාගේ සිත දූෂණය විය. එහෙත් දෙවියන්වහන්සේ මිනිසාට දක්වන ප්‍රේමය කිසි ලෙසකින්වත් අඩු නොකළ බව ශුද්ධ බයිබලයෙන් පෙනේ.

දේව ප්‍රේමයෙන් ඈත් වීම කරණකොට ගෙන මිනිසා දූෂිත තත්ත්වයට පත්වීමට මූලික වූ කරුණු පහත රූපය තුළින් අවබෝධ කර ගනිමු.



ප්‍රේමය පිළිබඳව පාවුල්තුමා කොරින්ති වාසීන්ට ලියූ හසුනේ 'ප්‍රේම පාරමිතාව'


කියවා බලමු.

**1 කොරින්ති 13:1-13**

මිනිසුන්ගේ හා දේව දූතයන්ගේ භාෂාවලින් කථා කළත්,
දිවැසි වැකි දෙසීමේ වරම් තිබුණත්,
සියලු අභිරහස් ගැන අවබෝධය ද
සකල ඥානය ද තිබුණත්,
බලවත් විශ්වාසයක් තිබුණත්
දන් දීම සඳහා සියල්ල වෙන් කළත්,
**ප්‍රේමය නොමැති නම්**
මම ඝෝෂා කරන සාණ්ටාරයකට හෝ කටුක රාවය දෙන කෛතාලමකට
හෝ සමාන වන හිස් තැනැත්තෙක් වෙමි.

දැන් අපි ප්‍රේමය අපගේ ජීවිතවලට කොතරම් අවශ්‍ය වන්නේ දැයි සොයා බැලීමට යොමු වෙමු.

**ප්‍රේමය**




සදහට ම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාව ප්‍රේමයයි.

ඉහත සඳහන් ලක්ෂණ අනුව 'ප්‍රේමය' යන වචනයේ ගැඹුරු බව හා අර්ථවත් බව අපට පෙන්නුම් කරන අතර, කිතුනු ජීවිතයට ඇති ප්‍රේමයේ පදනම මින් විග්‍රහ කෙරේ.

අප දැන් ජේසුස් වහන්සේ ප්‍රේමය සම්බන්ධව වදාළ පහත සඳහන් බයිබල් කොටසට අපගේ අවධානය යොමු කරමු.

**කියවා බලමු.**

**ශු. මාක් 12:29-33**

**එහි ප්‍රධාන කොටස් දෙකකි.**

**1. තමාගේ මුළු ජීවිතයෙන් ම දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම.**

මින් අදහස් වන්නේ පුද්ගලයකු මුළු පුද්ගලභාවය තුළින් ම දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම උන්වහන්සේගේ කැමැත්ත බවයි.

**2. තමාට මෙන් ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම.**

පුරාණ ජුදෙව්වරුන් අතර, අසල්වැසියන්ට ප්‍රේම කිරීම ඔවුන් තේරුම් ගත්තේ තමන්ගේ ම ජාතියේ සහ ආගමේ අයට පමණක් ප්‍රේමය දැක්වීමෙන් ය. නමුත් ජේසුස් වහන්සේ ජුදෙව්වකු ලෙසට මෙයට නව අර්ථ කථනයක් ගෙන දුන් සේක. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව අසල්වැසියා යනු තමා වටා සිටින අවශ්‍යතාවෙන් පෙළෙන ඕනෑ ම කෙනකු බව පැහැදිලි ය. එම ප්‍රේමයට සීමාවක් නොමැත.

**එපීස 3: 17-19 දැන් අපි සැලකිල්ලට ගනිමු. එහි පාවුල්තුමා අපට පවසන්නේ,**

***සියලු සැදැහැවතුන් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයේ***
***දිගත්, පළලත්, උසත්, ගැඹුරත් වටහාගෙන***
***ශක්තිය ලබා ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අවබෝධ කරගෙන***
***දෙවියන් වහන්සේගේ පරිපූර්ණතාවෙන් පූර්ණ වන පිණිස ද***
***යාච්ඤා කරන ලෙසයි.***

ප්‍රේමයේ පදනම මත තම ජීවිතය ගොඩනැගී ඇති විට එය **යාච්ඤාවෙන්** වඩා සවිමත් වන බව පාවුල්තුමා එපීස වැසියන්ට පෙන්වා දෙයි. එවැනි ජීවිතයකට ක්‍රිස්තුස්වහන්සේ සිත් තුළ වාසය කරන්ටත් ප්‍රේමයේ ස්ථිරව පිහිටා සිටින්ටත් **ඇදහිල්ල** අවශ්‍ය වේ. එසේ ම සියලු සැදැහැවතුන් සමග සාමූහික ව ක්‍රිස්තුස්වහන්සේගේ සීමා රහිත ප්‍රේමය අවබෝධ කර ගැනීම ද වැදගත් වෙයි. මෙසේ අපගේ ජීවිත ප්‍රේමයෙන් මුල් බැස ස්ථිර ව පිහිටා සිටින විට පූර්ණ ජීවිත බවට පත් වේ.

යම් පුද්ගලයකුට තම ජීවිත කාලය තුළ දී විවිධ වයස් සීමාවන් පසු කිරීමට සිදු වේ. ඒ අනුව ප්‍රේමය අත්විඳින්නට අවස්ථාව උදාවේ. ප්‍රථමයෙන් ම යම් පුද්ගලයෙක් ළදරුවකු, දරුවකු හැටියට, අන් අයගේ ආදරය ලැබීමට යොමු වේ. අප බලාපොරොත්තු වන ප්‍රේමය ද, පෙරළා අප ඔවුන් වෙත දක්වන ප්‍රේමය ද ඉතාමත් සුන්දර ය. ඒ තුළින් ලබන සුරක්ෂිත බව, රැකවරණය දරුවකු හට ඔවුන් නව යොවුන් වියට එළඹෙන තෙක් ම අත්‍යවශ්‍ය ය. මේ කාලය තුළ අපට වඩා වයසෙන් වැඩි අත්දැකීමෙන් පූර්ණ වැඩිහිටියන්ටත්, ගුරුවරුන්ටත්, කීකරු ව කටයුතු කිරීමට සිදු වේ. විශ්වාසය, තේරුම් ගැනීම නිවැරදි බව ආදී ලක්ෂණ පෙරදැරිව කටයුතු කළහොත් වැඩිහිටියන් හා ගුරුවරුන්ගේ ප්‍රේමය දිනාගත නො හැකි ද? එම ප්‍රේමය තුළ නව යොවුන් වියේ දරුවකුගේ නිවැරදි මග සලකුණු වී ඇත.

පාසල් දිවියේ සුන්දර ම කාල පරාසය නව යොවුන් වියට අයත් වේ. මෙහි දී තම මිතුරු මිතුරියන්ට වඩා විශ්වාසවන්ත වූ කෙනකු නොමැති යැයි සිතා කටයුතු කරන බොහෝ අවස්ථාවන් අපගේ දිවිය තුළ දැක ගත හැකි ය. නමුත් තම සම වයස් මට්ටමේ සිටින්නාවූ මිතුරකුට හෝ මිතුරියකට යම් ගැටලුවක් ඇති වුවහොත් අප ඔවුන්ගේ උදව්වට පැමිණිය යුතු ය. එවැනි අවස්ථාවක දී ක්‍රිස්තුස් වහන්සේට අයිති අප ඔහුට හෝ ඇයට බුද්ධිමත්ව තීරණ ගැනීමට උදව් වීම ප්‍රේමයේ ගුණාංගයක් බව තේරුම් ගැනීම වැදගත් වේ.

අප ජීවත් වන සමාජයේ, සභාවේ සහ පවුලේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වය ම සිටී. ජේසුස් වහන්සේ එවැනි සමාජයක අපට ජීවත් විය යුතු ආකාරය මනාව පෙන්වා දෙන සේක. පුරුෂ පාර්ශ්වය විසින් ස්ත්‍රී පාර්ශ්වය පහත නොහෙළා ප්‍රේමයෙන් පිළිගත යුතු බව පවසන සේක. උන්වහන්සේගේ ප්‍රේමය සමාජය විසින් පහත හෙළු ස්ත්‍රීන්ට ද දැක්වූ සේක. අප ද ප්‍රේමයේ තිබිය යුතු අසීමාන්තික ගුණාංගය තේරුම් ගෙන එකිනෙකාට ගෞරවයෙන් සැලකීම කළ යුතු ය. එය ප්‍රේමයේ පදනම යි.

ප්‍රේමය වඩාත් අර්ථ ගැන්වෙන්නේ වැය වීම තුළ ය. ජේසුස් වහන්සේගේ ජීවිතය, සේවය, දුක් විඳීම, මරණය තුළ ද ගැබ්ව ඇත්තේ පරිත්‍යාගි වූ ක්‍රියාකාරී ප්‍රේමය යි. සැබෑ ප්‍රේමය නම් එය යි. ප්‍රේමය ලොවට විදහාපාන අප ද දේව ප්‍රේමය කරණකොට ගෙන වැය වීමේ ප්‍රේමයකින් දිවි ගෙවීමට වග බලාගත යුතු ය.

මෙසේ කිතුනු අපගේ ජීවිත පැවැත්මෙන් නැගෙන ප්‍රේමයේ සිසිල් දිය දහරා මගින් සමාජය පුරා පවතින වෛරයේ, කුරිරුකමේ ගිනි ජාලා නිවා දැමිය යුතු ය. ක්‍රිස්තුස් වහන්සේ තුළින් දිස්වූ දෙවියන් වහන්සේගේ ප්‍රේමය ලොවට බෙදන්නට ක්‍රියාකාරී ප්‍රේමය යොදා ගනිමු.

**ක්‍රියාකාරකම**

1. කිතුනු අපගේ ජීවිතවල පදනම වන ප්‍රේමය පිළිබඳ ඔබ උගත් කරුණු 3 ක් ලියා දක්වන්න.

2. තම ජීවිතයෙන් ප්‍රේමය විදහා පෑ නූතන සමාජයේ චරිත දෙකක් නම් කරන්න.